## උද්භිද උද්‍යාන භාර අරමුදල - 2017

---

උද්භිද උද්‍යාන භාර අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා භාණ්ඩාගාරයේ ලේකම්, කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයේ ලේකම්, උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ, මහා භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අතර, 1996 දෙසැම්බර් 20 දින එළඹෙන ලද ගිවිසුමෙහි (4)(ජේ) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විස්තරාත්මක වාර්තාව උද්භිද උද්‍යාන භාර අරමුදලේ සභාපති වෙත 2018 අප්‍රේල් 27 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට උද්භිද උද්‍යාන භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(අ) ප්‍රමිතයෙහි 58 වගන්තිය අනුව දේපල පිරියත හා උපකරණ ක්ෂය අයිතමයන් සඳහා මුලින් හඳුනාගත් වටිනාකම එහි වැදගත් කොටස්වලට වෙන්කර ඒ එක් එක් කොටස වෙන් වෙන්ව ක්ෂය කළ යුතු වුවද මෙම අරමුදලේ ඉඩම් වැඩිදියුණු කිරීම් සඳහා සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.21,125,089 ක්ද ඇතුළුව එකතුව රු.231,614,009 ක් වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයෙහි 69 වගන්තිය අනුව වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙනා පසුව වුවද එයින් බැහැරව මිලදී ගන්නා වර්ෂයේ ක්ෂය නොකර ඉවත් කරන වර්ෂයේ සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කරන ප්‍රතිපත්තියක් අරමුදල විසින් හඳුනාගෙන තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගම්පහ උද්භිද උද්‍යානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවකට අදාලව ලබා දී තිබුණු රු.4,738,476 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් වී තිබියදී ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට තවදුරටත් නොපියවූ අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 1996 පෙබරවාරි 14 දිනැති අංක 95/3010/105/221 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව උද්භිද උද්‍යානවල වාර්ෂික ප්‍රවේශපත් ආදායමින් සියයට 25 ක් උද්භිද උද්‍යාන භාර අරමුදලට ආදායමක් වශයෙන් වෙන්කළ යුතු බව දක්වා තිබුණද අරමුදල විසින් ලද මුළු ප්‍රවේශපත් ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණි. නමුත් ගණනය කළ සියයට 25 ආදායමට වඩා භාණ්ඩාගාරය විසින් ලබාදෙන අග්‍රිම මුදල අඩුවීම හේතුවෙන් අරමුදල විසින් එම වෙනස ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.171,988,473 ක ලැබිය යුතු ගිණුම් ශේෂයක් ඇති වී තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2014 දෙසැම්බර් 29 දිනැති අංක 25/2014 (1) දරන සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2015 ජූලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය සහ 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත ප්‍රකාරව තත්කාර්ය සේවා පදනම යන සංකල්පයක් සැළකිල්ලට ගෙන කම්කරු සේවය ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.14,519,023 ක් වැටුප් ලෙස ගෙවා තිබුණද එම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලට දායක කරගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතුවලින් රු.134,504,012ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.152,235,357ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,731,345 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ප්‍රවේශ පත්‍ර ආදායම රු.10,824,703 කින් වැඩි වුවද ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු වියදම්, කම්කරු වියදම්, මල් සංගම් වියදම්, මල් වගා වියදම් (රෝයල් උද්‍යානය) හා ආරක්ෂක වියදම් පිළිවෙළින් රු.2,110,993 කින්, රු.4,907,717 කින්, රු.5,402,316 කින්, රු.6,081,025 කින් හා රු.7,750,236 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ

(අ) ජාතික ශාබාගාරයේ වියළි නිදර්ශක සඳහා බාකෝඩ් ලේබල් යෙදීමේ කාර්යය සඳහා 2017 අගෝස්තු මාසයේදී රු.887,402 ක් ගෙවා බාකෝඩ් ලේබල් මිලදී ගෙන තිබුණද, අවශ්‍ය වෙනත් උපාංග නොමැති වීම හේතුවෙන් විගණන දිනය වූ 2018 අප්‍රේල් 18 දින වනවිටත් මේවා භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) අරමුදලේ කටයුතු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී අනුමත කරන ලද සේවා කොන්දේසි ඇතුළත් විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර නොතිබුණි.

(ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි ව්‍යවස්ථාපිත නොවූ අරමුදල් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට හැකිවන පරිදි අදාළ හේතු දක්වමින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරන ලෙස දන්වා තිබුණු නමුත්, අරමුදල පනතක් මගින් නීතිගත කිරීම සඳහා 2018 අප්‍රේල් 18 දින වන විටත් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) උද්භිද උද්‍යාන භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු.240,000 ක් ගෙවීමට කළමනාකරණය විසින් කටයුතුකර තිබුණි.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

විධිමත් බඳවා ගැනීමේ පරිපාටියකින් තොරව 2008 දෙසැම්බර් 01 දිනැති අරමුදලේ ලේකම්ගේ පත්වීම් ලිපිය පරිදි පරිපාලන සහකාර තනතුර සඳහා විශ්‍රාමික නිලධාරියෙකු බඳවාගෙන වාර්ෂිකව කාලය දිගු කරමින් සේවයේ යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට නිලධාරියාගේ වයස අවුරුදු 71 ක්ව පැවති අතර, ආයතන සංග්‍රහය අනුව රජයේ නිලධාරීන්ට හිමි නිවාඩු හිමිකම් එම නිලධාරියාට ලබා දී තිබුණි.

## 5 . පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගෙවීම් පාලනය | i. මුදල් රෙගුලාසි ප්‍රකාරව වවුචර් පිළියෙළ කිරීම, පරීක්ෂා කිරීම, සිදුකර නොතිබීම.<br>ii. අත්තිකාරම් පියවීමේදී අදාළ බිල්පත්වල මුල් පිටපත් වෙනුවට ඡායා පිටපත් භාර ගෙන අදාළ පියවීම් සිදු කර තිබීම. |
| (ආ) මානව සම්පත් කළමනාකරණය | කාර්යමණ්ඩල බඳවා ගැනීම, රාජකාරී පැවරීම සහ අධීක්ෂණ වැඩපිළිවෙළවල් නිසි පරිදි සිදු නොවීම. |
| (ඇ) ගිණුම්කරණය | ගනුදෙනු සිදුවන අවස්ථාවේදීම අදාල ලෙජර්වල සටහන් නොකිරීම. |